**ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව**

**---------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ **1.6** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර**,** මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්**,** වියදම්**,** වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය**.**

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් නොවන ලැබීම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම රු.1,740,746 ක් අඩුවෙන්ද, අත්තිකාරම් අය කර ගැනීම් රු.109,670 ක් වැඩියෙන්ද දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.1,631,076 කින් ඌන ගණනය වී තිබුණි. | වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම හා අත්තිකාරම් අය කර ගැනීම් නිවැරදි කර, මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කරන ලද බව. | මුදල් ප්‍රවාහ නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුයි. |

**(ආ) පුනරාවර්තන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දැරූ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.242,430 ක් හා සහනාධාර සහ මාරුකිරීම් රු.143,679,980 ක් හා වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.357,650 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රවාහය රු.144,280,060 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පුද්ගල පඩිනඩි, මෙහෙයුම් වියදම්, සහනාධාර සහ මාරු කිරීම් හා වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කරන ලද බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව දැක්විය යුතුයි. |

**(ඇ) මූලධන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම හෝ වෙනත් ආයෝජන අත්කර ගැනීම් තුළ මු.රෙ.208 යටතේ | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වැරදීමකින් සටහන් කර ඇති අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කරන ලද බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව දැක්විය යුතුයි. |

| | | |
|---|---|---|
| අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් දැරූ රු 1,975,930 ක්ද ඇතුළත් වී තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුළු මුදල් ප්‍රවාහය රු.1,975,930 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 ඡේදය අනුව තවදුරටත් වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් පවතීනම් ඒවා හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි විට තක්සේරු අගයට හෝ වාර්තා කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු ජේෂ පාසැල් 09 ක, පෙහෙකම්හල් 08 ක හා සංචාරක නිවාස 02 ක ඉඩම්වල හා වාහනයක වටිනාකම් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම් ගත කර නොතිබුණි. | ඉඩම් සම්බන්ධ තක්සේරු වාර්තා මේ වන තෙක් ලැබී නොමැති බැවින් තක්සේරු කිරීමට කමිටුවක් පත්කිරීමට නියෝග ලැබී ඇති බව. එමෙන්ම අංක 51-5959 දරන ටොයෝටා වර්ගයට අයත් වෑන් රථය 2022 වර්ෂයේ දිගු කලක් අළුත්වැඩියා කටයුතු සඳහා ගරාජයේ තිබූ බැවින් තක්සේරු වාර්තා ලබා ගැනීමට නොහැකි වූ බව. | අදාළ චක්‍රලේඛ, මාර්ගෝපදේශයන් ට අනුකූලව මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

**(ඉ) විගණන සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු ලෙස දක්වා තිබූ ජේෂකර්මාන්ත පුහුණු ආයතන 14 ක සහ සංචාරක නිවාස දෙකක අයිතිය තහවුරු කර ගැනීමට නීත්‍යානුකූල ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරන ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවධානය යොමු කර ඇති බව. | පරිහරණය කරන ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තලල්ලේ බලවේග පේෂ කර්මාන්ත ඉඩම හා ගොඩනැගිල්ල 2010 වර්ෂයේ සිට වසර 30 ක් පුද්ගලික සමාගමකට බදු දී තිබියදී 2016 වසරේ සිට බදු ගෙවීම පැහැර හැර තිබුණි. 2016 සිට 2019 දක්වා වූ රු.8,910,000 ක හිඟ බදු ශේෂය, 2022 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි. තවද, එම ගොඩනැගිල්ල සහිත ඉඩම බදුකරු භුක්ති විඳිමින් සිටිය ද විගණිත දින දක්වාත් භාරදීමට කටයුතු කර නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තු උපදෙස් පරිදි බදු ගිවිසුම 2019 සැප්තැම්බර් 02 දින සිට අවසන් කර ඇති අතර, හිඟ බදු මුදල අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට අදාළ ලිපි ලේඛන 2020 ජනවාරි 30 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. තවද ඉඩම සම්බන්ධව 2022 අගෝස්තු 08 දින ඉඩම් කොමසාරිස් ජනරාල්ගෙන් උපදෙස් ඉල්ලා ඇති බව. | හිඟ බදු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | යටිනුවර බලවේග පේෂකර්මාන්ත ආයතනය, පෞද්ගලික ආයතනයක් වෙත 2000 වසරේ සිට වසර 30 කට බදු දී තිබුණි. අනවසර පදිංචිකාරියක් එම පරිශ්‍රයේ රැඳී සිටීම හේතුවෙන් බදු දේපළෙහි නිරවුල් අයිතිය ලබානොදීම මත 2000 වර්ෂයේ සිට 2012 වසර දක්වා ගෙවිය යුතු බදු මුදල් රු.2,756,000 ක් ගෙවීම බදුකරු විසින් පැහැර හැර තිබුණි. එම මුදල් අයකර ගැනීමට සහ අනවසර පදිංචිය ඉවත්කර ඉඩමෙහි නිරවුල් භුක්තිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරීමට විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | නීතිපති උපදෙස් අනුව, අනවසර පදිංචිය ඉවත් කිරීම ප්‍රාදේශීය ලේකම් වෙත යොමුකිරීමට 2018 ජූලි 22 දින දැනුම්දී ඇති අතර හිඟ බදු මුදල වාරික වශයෙන් ගෙවා අවසන් කිරීමට බදුකරු විසින් ඉල්ලීමක් 2023 අප්‍රේල් මස ඉදිරිපත් කර ඇති බව. | හිඟ මුදල් අයකර ගැනීම සහ අනවසර පදිංචිය ඉවත්කර ඉඩමෙහි නිරවුල් භුක්තිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 1996 වර්ෂයේ සිට වසර 30 ක් සඳහා බිබිල නිම්හල ආයතනය පුද්ගලික සමාගමක කළමනාකරණ අධ්‍යක්ෂකවරයෙකුට බදු දී තිබුණි. එම සමාගමෙන් අයවිය යුතු හිඟ බදු මුදලට අදාලව 2022 සැප්තැම්බර් 27 දිනැති අවසාන බේරුම්කරණ තීන්දුව ප්‍රකාරව රු.1,681,250 ක් හා පොළිය ගෙවීමට නියෝග කර ඇතත්, බදුකරු ගෙවීම් පැහැර හැර තිබුණි. | බේරුම්කරණයේදී ලබා දුන් නියෝගය අනුව කටයුතු නොකිරීම නිසා, ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ ලිපි ලේඛන 2022 දෙසැම්බර් 05 දින නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කළ බව. | ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගෙන හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාමගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් වසර දෙකත් තුනත් අතර කාලයක සිට අයවිය යුතු රු.177,805 ක ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් සකස් කිරීමට අදාළ තොරතුරුවල වූ අඩුපාඩු නිවැරදි කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යවා ඇති අතර එම ණය ශේෂ නිරවුල් කළ විගස ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කරනු ලබන බව. | ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ග්‍රාමීය මට්ටමින් ව්‍යාප්ත කර ග්‍රාමීය ව්‍යවසායකයින් බිහිකිරීමේ අරමුණ මත ක්‍රියාත්මක අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ගම්මාන ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 හා 2022 වර්ෂවල මිලදීගත් අත්යන්ත්‍ර ආශ්‍රිත උපකරණ වලින් වටිනාකම රු.23,960,750 ක් වූ අත්යන්ත්‍ර කට්ටල 220 ක් සහ වයින්ඩින් යන්ත්‍ර කට්ටල 195 ක් වාර්තාවේ දින වන විටත් නිශ්කාර්යව පැවතුණි. | ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව සලකා අවශ්‍ය කරනු ලබන අත්යන්ත්‍ර ප්‍රමාණය පුරෝකථනය කර ප්‍රසම්පාදනය කළ ද අත්යන්ත්‍ර ව්‍යාපෘති ආරම්භ කොට මාස 06 ක් පමණ යන විට අනපේක්ෂිත අයුරින් ආරම්භයේ දී අපේක්ෂා කළ පුහුණුලාභීන් ප්‍රමාණය, පුහුණුව අවසන් නොකිරීම හේතුවෙන් අත්යන්ත්‍ර අතිරික්ත වීමක් සිදුව ඇති බව.<br>එම අත්යන්ත්‍ර කට්ටල ඉදිරියේදී නිසි පරිදි ව්‍යාපෘති ප්‍රතිලාභීන් වෙත ලබා දීමට හැකි බව. | මෙම නිශ්කාර්යව පවතින අත්යන්ත්‍ර කට්ටල අත්යන්ත්‍ර ව්‍යාපෘති ප්‍රතිලාභීන් ලබා දීමට කටයුතු කළ යුතු අතර පසුව මිලදී ගැනීමේදී නිවැරදිව පුරෝකතනය කර ව්‍යාපෘති සංඛ්‍යාවට අනුකූලව මිලදී ගැනීම් කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

සමාලෝචිත වර්ෂයේ පේෂකර්ම පුහුණු ආයතන 14 ක පරිපාලනය වෙනුවෙන් රු.මිලියන 3.835 ක් වැය කර තිබුණද අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට ශ්‍රමිකයින් පුහුණු කිරීම සම්බන්ධයෙන් පැවැත් වූ පාඨමාලා වල ප්‍රගතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ සය මාසික පාඨමාලාව 2021 හා 2022 වර්ෂයේ දී මාතර හා කටුබැද්ද පේෂකර්ම පුහුණු ආයතන දෙකෙහි පමණක් පවත්වා තිබූ අතර පිළිවෙලින් සිසුන් දෙදෙනෙකු හා 04 දෙනෙකු පමණක් පාඨමාලාව අවසන් කර තිබුණි. | අයදුම්කරුවන්ගේ ඉල්ලීම අනුව සය මාසික පාඨමාලාව දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අතර ඉල්ලීම් ඉදිරිපත්ව තිබූ ප්‍රදේශ අනුව මාතර හා කටුබැද්ද පුහුණු ආයතනවල මෙම පාඨමාලාව පවත්වන ලදී. නල්ලූර්, මාතර, කොට්ටල, කටුබැද්ද යන පේෂ පාසැල් පුහුණුව සඳහා මුලින් පැමිණි සිසුන් පාඨමාලාව පැවැත්වෙන අතරතුර රටේ ඇති වූ ආර්ථික අර්බුදය මත වෙනත් රැකියා සොයා ගැනීම සහ ප්‍රවාහන වියදම ඇතුළු ජීවන වියදම් ඉහල යාම ආදී හේතු මත අතර මගදී පාඨමාලාව හැරගොස් ඇති බව. | පේෂ කර්මාන්ත පුහුණු කටයුතු සඳහා වැය කරනු ලබන මුදලට සාපේක්ෂව මෙම පාඨමාලා සඳහා සිසුන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ සිසුන් පිළිවෙලින් 147 ක් හා 87 ක් අවසන් සහතික පත්‍ර පාඨමාලාව අවසන් කර ඇතත්, පාඨමාලා සඳහා සිසුන්ගේ සහභාගීත්වය ඉකුත් වර්ෂයට වඩා සියයට 40 කින් අඩු වී තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පේෂකර්ම පුහුණු ආයතන 4 ක පාඨමාලාව අවසන් කළ සිසුන් ගණන 1 ක සිට 4 ක් දක්වා පරාසයක පැවතීම ඉතා අඩු මට්ටමක් විය. | | |
| (ඈ) | සිසුන් 119 කට නේවාසික පහසුකම් සැපයිය හැකි පේෂකර්ම පුහුණු ආයතන 13 කින් සමාලෝචිත වර්ෂයේදී සිසුන් 58 ක් පමණක් නේවාසිකාගාර පහසුකම් ලබාගෙන තිබුණි. ඒ අනුව සැපයිය හැකි නේවාසිකාගාර පහසුකම්වලින් සියයට 52 ක් උපයෝජනය වී නොතිබුණි. | | |

### 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අයිතිය නිශ්චිතව හඳුනාගෙන නොමැති, මුරකුටියක් හා ගොඩනැඟිලි 02 ක් සහිත රාජගිරියේ පිහිටි පර්චස් 30කින් යුක්ත ස්වාභාවික වර්ණ ගැන්වීම් මධ්‍යස්ථානය වසර 2කට වැඩි කලක සිට උපයෝජනය නොවී පැවතුණි. | එම ඉඩම ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් වෙත භාර දෙන ලෙස දන්වා යවා ඇති බව. | මෙම ගොඩනැගිලි අදාළ කාර්යය සඳහා වර්තමානයේ භාවිතා නොවන නිසා ඵලදායි ලෙස යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දින භෞතිකව පවතින නූල් තොගයෙහි ප්‍රමාණය 6,798 Kg ක් විය. එසේ වුවද එම තොගය ජේෂ පාසැල් සඳහා පවත්වාගත යුතු නූල් තොග අවශ්‍යතාවය ඉක්මවා පැවතිබව නිරීක්ෂණය වූ අතර, එම අතිරික්ත තොග ඵලදායී ලෙස යොදාගැනීමට වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | ගබඩාවෙහි පවතින නූල් තොග ප්‍රමාණය ජේෂ පාසල් සඳහා භාවිතා කර අවසන් වන තුරු නැවත නූල් තොග මිලදී ගැනීමට කටයුතු නොකරන ලෙස විෂය භාර නිලධාරිව දැනුවත් කළ බව. | අතිරික්ත තොග ඵලදායී ලෙස යොදාගැනීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත වී ඇතත් පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. | **අභ්‍යන්තර විගණන තනතුරට නිලධාරියෙකු ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර එතෙක් එම තනතුරේ වැඩබැලීම සඳහා සුදුසු නිලධාරියෙකු ලබාදීමට කටයුතු කරන ලෙස කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇති බව.** | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) පරිදි අභ්‍යන්තර විගණකවරයකු **පත්කළ යුතුය.** |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු දෙපාර්තමේන්තුවේ නොමැතිවීම, කොවිඩ් 19 වසංගත තත්ත්වය හා පැවති ආර්ථික අර්බුදකාරී තත්වය හමුවේ දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ නමුත් එක් අමාත්‍යාංශ කමිටු රැස්වීමක් 2022 අගෝස්තු 24 දින පවත්වා දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු සාකච්ඡා කොට ඇති බව. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කළ යුතුය. |